කලාප අධ්‍යාපන කාර්යාලය - රත්නපුර

බහුවරණ ප්‍රශ්න සංග්‍රහය

විෂය- සාමාන්‍ය තොරතුරු තාක්ෂණය

සකස් කළ ගුරුභවතාගේ නම - ආර්.ඒ.ඩිලක්ෂිකා ඉඳුනිල් රූපසිංහ

පාසල - ර/පත්බේරිය නාරද ම.ම.වි.

ශ්‍රේණිය - 12

පාඩම - 8

**8 ඒකකය - ජීවිතයේ සාර්ථකත්වය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂනය කාර්යක්ෂමව හා ඵලදායි අන්දමින් භාවිතා කරයි.**

1. අංකිත හැඳුනුම්පත් ලබා දීම මගින් රජයට ලාභයක් නොවන්නේ පහත කුමන අවස්ථාවේදීද?

    1) පරිපාලන හා නිත්‍යානුකූල කටයුතු වලදී කාර්යක්ෂමව මැදිහත් වීමට හැකි වීම

    2) තොරතුරු විශාල ප්‍රමාණයක් ඇතුළත් කිරීමට හැකි වීම

    3) තොරතුරු සොයා බැලීම සඳහා තාක්ෂණික දැනුම අවශ්‍ය වීම

    4) රජයට අවශ්‍ය වූ විට පුද්ගලික තොරතුරු ලබා ගත හැකි වීම

2. පහත අවස්ථා අතරින් තොරතුරු තාක්ෂණය භාවිතා කිරීම නිසා ඇතිවන සමාජයීය ගැටළුවක් නොවන්නේ

    1) අවම කඩදාසි පරිභෝජනය

    2) අංකිත බෙදුම තව තවත් පුළුල් වීම

    3) මානසික ආතතිය සඳහා හේතුවක් වීම

    4) අන්තර් පුද්ගල සම්බන්ධතා අඩු වීම

3. අංකිත බෙදුම යා කිරීම (Bridging Digital Divide) සඳහා පහත කවරක් උදව් වේද?

    A- අඩු පහසුකම් ඇති පාසල් වලට පරිගණක පරිත්‍යාග කිරීම

    B-අදාළ ප්‍රජාවෙහි පරිගණක සාක්ෂරතාවය ඉහළ නැංවීම

    C-අන්තර්ජාල ප්‍රවේශයන් නැති ප්‍රජාව සඳහා එම සම්බන්ධතාවය ලබා දීම

    1) A පමණි

    2) C පමණි

    3) A,B පමණි

    4) A,B,C සියල්ලම

4. පරිගණක භාවිතයේදී ඇතිවන පුනරවර්තන ආතති ආබාධ අඩු කිරීම සඳහා පහත සඳහන් කවරක් උදව් වේද?

A- යතුරු ලියනය කරන විට මැණික් කටුව කෙළින් සහ අතේ පහළ කොටස හා සම මට්ටමේ තබා ගැනීමෙන්

B-ඇස් රුදාව වැළක්වීම සඳහා ඇසි පිය ගැසීම වැනි පූර්ව ආරක්ෂණ ක්‍රම අනුගමනය

C-චක්‍ර එළිකණ වැළක්වීම සඳහා සුදුසු ස්ථානයක පරිගණකය තැබීමෙන්

1) A පමණි

2) B පමණි

3) A,B පමණි

4) A,B,C සියල්ලම

5. හානිකර මෘදුකාංග වලින් පරිගණය සහ පරිගණක ජාල ආරක්ෂා කර ගැනීම සඳහා ගත හැකි පූර්ව ක්‍රියා මාර්ග වන්නේ

A-ප්‍රතිවයිරස මෘදුකාංගයක් ස්ථාපනය කිරීම හා එය යාවත්කාලීන කිරීම

B-Guard/Shield/Auto scan/update නිරතුරුවම ක්‍රියාත්මකව පවත්වාගැනීම

C-සැම විටම නිත්‍යානුකූල මෘදුකාංග පමණක් ස්ථාපනය කිරීම

D-පරිපාලක ගිණුමට අමතරව තවත් පරිශීලක ගිණුම් පවත්වා ගැනීම

1) A පමණි

2) A,B පමණි

3) A,B,C පමණි

4) A,B,C,D සියල්ලම

6. හසුරු කුසලතා අහෝසි වීම තොරතුරු තාක්ෂණ ය භාවිතයේ එක් අහිතකර ප්‍රතිඵලයකි.පහත සඳහන් ඒවායින් කුමක් හසුරු කුසලතා අහෝසි කිරීම සඳහා උදාහරණයක් වේද?

A-කර්මාන්තශාලා යන්ත්‍ර භාවිත කිරීම පුද්ගලයින්ගේ හැකියා ප්‍රතිස්ථාපනය කරයි.

B-ඉලෙක්ට්‍රොනික පොත් සහ සඟරා ආදිය නිසා පුස්තකාල සහ ඒ ආශ්‍රිත රැකියා අහෝසි වීම සිදු විය හැකිය.

C-දුරස්ථ සහ මාර්ගගත අධ්‍යාපනය ගුරු සම්පත සීමාසහිත කරයි

D-සෞඛ්‍ය සම්බන්ධ කරුණු නිවසේදීම විසඳා ගත හැකි වන බැවින් සෞඛ්‍ය සහ රසායනාගාර සේවා නවතා දැමීමට සිදු වේ.

1) A පමණි
2) B,C පමණි
3) A,B,C පමණි
4) A,B,C,D සියල්ලම

7. පහත ප්‍රකාශන වලින් ඉලෙක්ට්‍රොනික වාණිජ්‍ය හි ලක්ෂණ පිළිබඳව සත්‍ය වන්නේ

A-අඩු ප්‍රාග්ධන යෙදවුම

B-පාරිභෝගිකයන්ගේ කාලය හා ශ්‍රමය නාස්ති වීම අඩු වීම

C-තරඟකාරීත්වය නිසා ඉහළ ගුණයෙන් යුතු භාණ්ඩ වෙළඳපලට පැමිණීම

1) A,B පමණි
2) B,C පමණි
3) A,C පමණි
4) A,B,C,D සියල්ලම

8. පහත දැක්වෙන කුමක් ඉලෙක්ට්‍රොනික සාප්පු සවාරියක් ලෙස සැළකිය හැකිද?

1) පරිගණකගත ගනුදෙනු සැකසුම් පද්ධතියක් භාවිත කරන සුපිරි වෙළඳසලකින් භාණ්ඩ මිලදී ගැනීම
2) සාප්පුවක ඇති පරිගණකයක් භාවිතයෙන් එහි ඇති භාණ්ඩවල තොරතුරු සොයා බැලීම
3) අන්තර්ජාලය හරහා භාණ්ඩ මිලදී ගැනීම
4) Telescope ලෙස හඳුන්වන වෙළඳසලකින් භාණ්ඩ මිලදී ගැනීම

9. ටෙලි වෛදකම සම්බන්ධයෙන් සත්‍ය වන්නේ කුමක්ද?

A-වෛද්‍යවරයා හා රෝගියා අතර සම්බන්ධතාව පවත්වා ගැනීම සඳහා අන්තර්ජාලය හෝ වෙනත් ජාල පද්ධති භාවිත කෙරේ.

B-ජාලගත වූ ප්‍රාදේශීය වෛද්‍ය ආයතන සමග සම්බන්ධතාව ඇති කරගනිමින් එහි සිටින රෝගීන් දුරස්ථව පරික්ෂා කිරීමට ඈත සිටින විශේෂඥ වෛද්‍යවරුන්ගේ සේවය ලබා ගත හැකිය.

C-සායනික කටයුතු, වෛද්‍ය හා සෞඛ්‍ය ක්ෂේත්‍ර අධ්‍යාපනික කටයුතු ,පරිපාලනමය කටයුතු හා පර්යේෂණ කටයුතු වඩා කාර්යක්ෂම කර ගැනීමට ටෙලි වෛද්‍යකම උපකාරී වේ.

1) A පමණි
2) A,B පමණි
3) A,C පමණි
4) A,B,C සියල්ලම

10. පහත වගන්ති සළකන්න.

A-E අපද්‍රව්‍ය අපරික්ෂාකාරී අයුරින් පරිසරයට බැහැර කිරීම

B-භාවිතයට ගත නොහැකි සංයුක්ත ප්‍රතිදීප්ත පහන් හා අනෙකුත් ඉලෙක්ට්‍රොනික උපකරණ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථාන වෙත භාර දීම

C-භාවිත කළ හැකි මට්ටමේ පවතින ඉලෙක්ට්‍රොනික උපකරණ ඉවත නොදමා වෙනත් ඇයට විකිණීම හෝ පරිත්‍යාග කිරීම

ඉහත ප්‍රකාශන අතරින් ආරක්ෂිතව ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා නිදසුන් වන්නේ

1) A,B පමණි
2) A,C පමණි
3) B,C පමණි
4) A,B,C සියල්ලම

| | | | |
|---|---|---|---|
| 1) | 3 | 6) | 4 |
| 2) | 1 | 7) | 4 |
| 3) | 4 | 8) | 3 |
| 4) | 4 | 9) | 4 |
| 5) | 4 | 10) | 3 |